# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,129 — 1960 මැයි 12 වැනි බ්‍රහස්පතින්ද — 12.5.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## මිළ පාලන දූන්වීම්

ඇම්ඇල් 28 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය | හාල් සහ වී

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

මාතලේ පාලන දිස්ත්‍රික්කයේ සහකාර (මිළ) ආහාර පාලක තැන්පත් බන්දුල සෝමසිරි ද සිල්වා වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තිය සමග කියවිය යුතු 3 (2) දරණ වගන්තියෙන් මට පැවරී තිබෙන බලතල අනුව—

(1) 1959 ජුලි 15 වෙනි දින අංක 11,808 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1959 ජුලි 10 වෙනි දිනැති අංක ඇම්ඇල් 27 දරණ මාගේ ආහාර මිළ නියෝගය 1960 අප්‍රියෙල් මස 11 වෙනි දින සිට අවලංගු කරමි.

(2) 1960 අප්‍රියෙල් 11 වෙනි දින සිට, මීට යාකර ඇති 1 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කොට්ඨාශවල, එම උපලේඛනයේ, 2 සහ 3 යන තීරවල සඳහන් මිළ ගණන් පිළිවෙළින් සලාක හාල් සහ සලාක වී ශුද්ධ බර හොණ්ඩරයක වැඩිම තොග මිළ ගණන් වශයෙන් නියම කරන අතරම, ඒ මිළ ගණන්වලට වැඩියෙන් ඒවා නොවිකිණිය යුතු බවද නියම කරමි.

(3) 1960 අප්‍රියෙල් 11 වෙනි දින සිට, මීට යාකර ඇති 2 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කොට්ඨාශවල එම උපලේඛනයේ 2 සහ 3 යන තීරවල සඳහන් මිළ ගණන් පිළිවෙළින් සලාක හාල් සහ සලාක වී ශුද්ධ බර රාත්තලක වැඩිම සිල්ලර මිළ ගණන් වශයෙන් නියම කරන අතර ඒ මිළ ගණන්වලට වැඩියෙන් ඒවා නොවිකිණිය යුතු බවද නියම කරමි.

(4) තවද, මේ නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) සලාක හාල් හෝ සලාක වී ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සළකන ලබන බවත්,

(ආ) සලාක හාල් හෝ සලාක වී ඕනෑම ප්‍රමාණයක් පාරිභෝගය හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකන ලබන බවත්,

මේ නියෝගයෙන් නියම කරමි.

(5) එසේම, කිසිම කෙනෙක් සලාක හාල් හෝ සලාක වී වෙන දෙයක් සමග මිශ්‍රකර නොවිකිණිය යුතු බවද නියම කරමි.

(6) එසේම, සලාක හාල් හෝ සලාක වී විකුණනවිට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත් මේ නියෝගයෙන් නියමිත වැඩිම මිළට ඇතුළත් වී ඇති බවද, නියම කරමි.

(7) තවද, මේ නියෝගයේ සඳහන් සලාක හාල් සහ සලාක වී විකිණිය හැකි වැඩිම මිළ ගණන් බල පවත්නා සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක සලාක හාල් හෝ සලාක වී සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම, එම ප්‍රදේශය සඳහා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බවද නියම කරමි.

(8) එසේම, මේ නියෝගයේ කාර්‍ය්‍ය සඳහා '' හොණ්ඩරය '' හෙවත් ''හො'' යන්නෙන්ද, '' රාත්තල '' හෙවත් '' රා.'' යන්නෙන්ද, සළකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව පිළිවෙළින් හොණ්ඩරයේ සහ රාත්තලේ බර බවද නියම කරමි.

(9) එසේම, මේ නියෝගයේ සඳහන් සලාක හාල් හෝ සලාක වී විකිණිය හැකි වැඩිම මිළ ගණන් බල පවත්නා සෑම පෙදෙසකම තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් සලාක හාල් හෝ සලාක වී විකුණන සෑම තැනැත්තෙකු විසින්ම, මිළයට ගන්නා ඉල්ලුවහොත්, මතු සඳහන්, එනම්:—

(අ) විකුණූ දිනය,
(ආ) සලාක හාල් හෝ සලාක වී විකුණූ ප්‍රමාණය;
(ඉ) විකුණූ සලාක හාල් හෝ වී වලට ගෙවූ මුදල;
(ඊ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද, යන විස්තර ඇතුළත් කුවිතාන්සියක් නිකුත්කළ යුතු බවද නියම කරමි.

1960 මැයි මස 4 වෙනි දින පස්වරු 3.40ට මාතලේදී අත්සන් තබන ලදී.

බන්දුල ඇස්. ද සිල්වා,
මාතලේ පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක.

## 1 වෙනි උපලේඛනය

| | 1 වෙනි තීරය (ගම්මුලාදනියාගේ කොට්ඨාශය) | 2 වෙනි තීරය හාල් ශුද්ධ බර හොණ්ඩරයක තොග මිළ රු. ශ. | 3 වෙනි තීරය වී ශුද්ධ බර හොණ්ඩරයක තොග මිළ රු. ශ. |
|---|---|---|---|
| 1. | නාගරික සිංහල ගම්මුලාදනි කොට්ඨාශය, නාගරික මුස්ලිම් ගම්මුලාදනි කොට්ඨාශය, හුලන්ගමුව-හරස්ගම, නාගොල්ල-පඩිවිට ... ... ... ... | 14 12 | 6 37 |
| 2. | අළුවිහාරේ බෝවත්ත-නුගපිටිය, වෙරගම, දොරකුඹුර, වාරියපොල, උකුවෙල, උඩුගම, පල්ලේගම (මා. ප. ප.), කඩුවෙල, කලල්පිටිය, ඉඹුලන්දන්ඩ, උල්පොතපිටිය, මානාබොඩ, මාරුකොන, ඕවිල්ල, ඕවල, රත්තොට-නිකවැල්ල, තැන්න-තිබබොටුවාව, පුරිජ්ජිල, වරකාමුරේ ... | 14 30 | 6 55 |
| 3. | වරාපිටිය-බන්ඩරපොල, දිවිල්ල, බෝදිකොටුව, උඩන්ගමුව, මුවන්දෙනිය, ගුරුබැබිල, ගුරලවෙල, රයිතලාව, නාරන්ගොල්ල, ගල්වඩුකුඹුර, මඩවල, මහවෙල, පල්ලේපොල, පල්දෙනිය, පුස්සැල්ල, කවුඩුපැලැල්ල, පමුණුව, යටවත්ත, රජ්ජම්මන, නාරන්ගමුව, පුවක්පිටිය (ග. ප.) දොඹවෙල, සැලගම, ගම්මුල්ල, අළුත්ගම, ඇඹීටියාව, මාතලාපිටිය, ඇටිපොල, උඩගම ... | 14 47 | 6 72 |
| 4. | කිරිමැටියාව ... ... ... ... ... | 14 56 | 6 81 |
| 5. | පොරෝකාරගම-අළුත්ගම, අඹන්පොල, නාලන්ද, අම්බොක්ක, ඉඹුල්පිටිය, ගලගම, වැටැස්යාය, ඇහැලේපොල, මීල්ලවාන, දැඹව, නාවරගොඩ, නෙළුවාකන්ද, නිකගොල්ල, බිබිල, ලේනාවල, පලාපත්වෙල (උ. මා.), පල්ලේහපුවිද, උඩස්ගිරිය, රත්වත්ත-වැලිගල, වහකෝට්ටේ, කුඹල් ඔළුව, වල්මෝරුව, කිරිඹරුව, අකුරම්බොඩ, කන්දේවත්ත, කොස්වත්ත, සුදුහකුරුගම, එළමල්පොත ... ... ... ... ... | 14 67 | 6 92 |
| 6. | දූල්ලෑව, ලෙනදොර, වැහිගල, දන්කන්ද, ආඳාවල ... ... ... | 14 84 | 7 09 |
| 7. | ගලේවෙල, පිලිහුඩුගොල්ල, කරවිලහේන, මෛල්පිටිය, නබඩගහවත්ත, බඹරගස්වැව, අළුත්වැව, බෙලියකන්ද, ඇඹුල්අඹේ, නයාකුඹුර, කළුන්දූව, තිත්තවැල්ගොල්ල ... ... | 14 80 | 7 05 |
| 8. | පාදෙනිය ... ... ... ... ... | 14 92 | 7 17 |
| 9. | බෙලිගමුව, දඹුබැදිරුප්ප, වලස්වැව, තලකිරියාගම ... ... ... | 14 98 | 7 23 |
| 10. | මකුලේමඩ, ඕපල්ගල, කෝන්ගහවෙල, ඕවිලිකන්ද ... ... ... | 15 02 | 7 27 |
| 11. | මාවුස්සාගොල්ල ... ... ... ... ... | 15 09 | 7 34 |
| 12. | ඉනාමළුව, පල්ලේගම (ව. ප. ප.), ඇරැවුල ... ... ... ... | 15 12 | 7 37 |
| 13. | ඇලහැර, හැලඹගහවත්ත, ඇලගමුව, මාරාගමුව ... ... ... | 15 19 | 7 44 |
| 14. | අවුඩන්ගාව, කන්ඩලම, පාළුවාව, කුඹුක්කඳන්වෙල, නිකවටන, සීගිරිය ... ... | 15 30 | 7 55 |
| 15. | කඹරව, පොත්තැටැවල, පුවක්පිටිය (හ. උ. ප.), කන්දේපිටවල, කෝට්ටපිටිය, කෝදූරුවාව ... | 15 37 | 7 62 |
| 16. | ගෙඩිගස්වැලැන ... ... ... ... ... | 15 47 | 7 72 |
| 17. | පල්ලේගම (ල. ප. ප.) ... ... ... ... ... | 15 97 | 8 22 |
| 18. | ඇටන්වල, කහගල, මහලකොටුව, පිටවල, ඉමාදූව, නාරන්ගමුව (ල. ප. ප.), රඹුක්කොළුව, හල්මිනිය, කිවුලේවාඩිය, විල්ගමුව, ගල්ගෙඩවල, අකරුහැඩිය ... ... | 16 32 | 8 57 |

## 2 වෙනි උපලේඛනය

| | 1 වෙනි තීරය (ගම්මුලාදනි කොට්ඨාශය) | 2 වෙනි තීරය හාල් ශුද්ධ බර රාත්තලක වැඩිම සිල්ලර මිළ රු. ශ. | 3 වෙනි තීරය වී ශුද්ධ බර රාත්තලක වැඩිම සිල්ලර මිළ රු. ශ. |
|---|---|---|---|
| 1. | නාගරික සිංහල ගම්මුලාදනි කොට්ඨාශය, නාගරික මුස්ලිම් ගම්මුලාදනි කොට්ඨාශය, බෝවත්ත-නුගපිටිය, හුලන්ගමුව-හරස්ගම, උල්පොතපිටිය, අළුවිහාරේ, වෙරගම, ඉඹුලන්දන්ඩ, වාරිය පොල, උකුවෙල, උඩුගම, පල්ලේගම (මා. ප. ප.), නාගොල්ල-පඩිවිට, කඩුවෙල, කලල්පිටිය, මානාබොඩ, මාරුකොන, ඕවිල්ල, ඕවල, රත්තොට-නිකවැල්ල, තැන්න-තිබබෝටුවාව, පුරිජ්ජල, වරකාමුරේ ... ... ... ... ... | 0 13½ | 0 06¾ |
| 2. | රජ්ජම්මන, නාරන්ගමුව (ග.ප.), දිවිල්ල, මහවෙල, උඩන්ගමුව, දෙරකුඹුර, දොඹවෙල, මුවන් දෙනිය, කවුඩුපැලැල්ල, අළුත්ගම, ගුරලවෙල, රයිතලාව, නාරන්ගොල්ල, ගල්වඩුකුඹුර, මඩවල, ගුරුබැබිල, පල්ලේපොල, පල්දෙනිය, පුස්සැල්ල, පමුණුව, යටවත්ත, කිරිමැටියාව, වරාපිටිය-බන්ඩරපොල, පුවක්පිටිය (ග.ප.) ... ... ... | 0 14 | 0 07 |
| 3. | උඩගම, පොරෝකාරගම-අළුත්ගම, සැලගම, ගම්මුල්ල, ඇඹීටියාව, අඹන්පොල, ගලේවෙල, මාතලාපිටිය, ඇටිපොල, නාලන්ද, ඉඹුල්පිටිය, ගලගම, වැටැස්සාය, පිලිහුඩුගොල්ල, කරවිල හේන, ඇහැලේපොල, මීල්ලවාන, මෛල්පිටිය, වල්මෝරුව, දැඹව, කිරිඹරුව, නාවරගොඩ, අකුරම්බොඩ, කන්දෙවත්ත, නෙළුවාකන්ද, නිකගොල්ල, සුදුහකුරුගම, බිබිල, ලේනාවල, පලාපත්වෙල, අම්බොක්ක, පල්ලේහපුවිද, එළමල්පොත, උඩස්ගිරිය, රත්වත්ත-ඩැලිගල, වහකෝට්ටේ, දූල්ලෑව, ලෙනදොර, වැහිගල, නයාකුඹුර, කොස්වත්ත ... ... | 0 14½ | 0 07¼ |
| 4. | ගෙඩිගස්වැලැන, පාදෙනිය, බෙලිගමුව, බෝදිකොටුව, ආඳාවෙල, දඹුබැදිරුප්ප, වැලස්වැව, කුඹල්ඔළුව, තලකිරියාගම, ඕපල්ගල, කෝන්ගහවෙල, ඕවිලිකන්ද, මකුලේමඩ ඉනාමළුව, පල්ලේගම (ව.ප.ප.), නබඩගහවත්ත, ඇලහැර, හැලඹගහවත්ත, කෝදූරුවාව, කෝට්ටපිටිය, මාරාගමුව, ඇලගවුව, ගල්බොඩ, බඹරගස්වැව, අළුත්වැව, බෙලියකන්ද, ඇඹුල්අඹේ, තිත්ත වැල්ගොල්ල, කළුන්දූව ... ... ... ... | 0 15 | 0 07½ |
| 5. | අවුඩන්ගාව, කන්ඩලම, පළුවාව, කුඹුක්කඳන්වෙල, නිකවටවන, සීගිරිය, කඹරව, දන්කන්ද, ඇරැවුල, මාඋස්සාගොල්ල ... ... ... ... | 0 15½ | 0 07¾ |
| 6. | ඇටන්වල, කහගල, මහලකොටුව, පිටවල, පොත්තැටවෙල, පුවක්පිටිය (ග.උ.ප.), කන්දේ පිටවල ... ... ... ... ... | 0 16 | 0 08 |
| 7. | පල්ලේගම (ල.ප.ප.), රඹුක්කොළුව, ඉමාදූව, නාරන්ගමුව, (ල.ප.ප.), හල්මිනිය (ල.ප.ප.), කිවුලේවාඩිය, විල්ගමුව, ගල්ගෙඩවෙල, අකරුහැඩිය ... ... ... | 0 16½ | 0 08¼ |

**සැළකිය යුතුයි.**—(අ) මේ මිළ ගණන් ඉහත සඳහන් හාල් සහ වී විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී ගණන්වලට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

(ආ) හොණ්ඩරයකට අඩු හෝ වැඩි සලාක හාල් හෝ සලාක වී ඕනෑම ප්‍රමාණයක් තොග වශයෙන් විකිණීමේදී ඉහත සඳහන් හොණ්ඩරයක තොග මිළ අනුව වැඩිම මිළ ගණන් ගෙවිය යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.